THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

NOT FOR SALE

# SUGGESTED SOLUTIONS

## KE3 (B) – Fundamentals of Law

මාර්තු 2017

All Rights Reserved

NOT FOR SALE

# 1 කොටස

**පිළිතුරු අංක 01**

1.1

ඉගෙනුම් ප්‍රතිඵල - 1.3.1

ශ්‍රී ලංකාවේ අධිකරණ සහ ඒවායේ කාර්යයන් හඳුනාගැනීම.

**නිවැරදි පිලිතුර - C**

1.2

ඉගෙනුම් ප්‍රතිඵල - 2.1.1

වලංගු ගිවිසුමක පූර්ව අවශ්‍යතා එනම් අර්පණය සහ ප්‍රතිග්‍රහණය, නෛතික සම්බන්ධතාවයක් ස්ථාපනය කිරීම සඳහා වූ චේතනාව, ප්‍රතිෂ්ටාව, ගිවිසුම් ශක්‍යතාවය සහ ආකෘතිය'යන සංකල්ප පැහැදිලි කිරීම. ගිවිසුම් එකඟතාවය, අර්පණය සහ ප්‍රතිග්‍රහණය, ගිවිසුම් ශක්‍යතාවය, ගිවිසුම් ආකෘති, අනුමැතියේ තත්‍යථාවය යන සංකල්ප නිර්වචනය කිරීම.

**නිවැරදි පිලිතුර - B**

1.3

ඉගෙනුම් ප්‍රතිඵල - 3.5.1

කල්බදු හා කුලී සින්නක්කර ගිවිසුම්වලට අදාල සිද්ධාන්ත සඳහන් කිරීම.

නිවැරදි පිලිතුර - **C**

1.4

ඉගෙනුම් ප්‍රතිඵල - 4.1.2

චෙක්පත්, විකිණුම් බිල්පත් සහ පොරොන්දු නෝට්ටුවල කාර්යය ව්‍යාපාරික සන්දර්භයක් තුල පැහැදිලි කිරීම.

**නිවැරදි පිලිතුර - D**

1.5

ඉගෙනුම් ප්‍රතිඵල - 4.3.1

විනිමය බිල්පත්වලට අදාලව 'යථාකාල ධාරකයා' සහ 'ඉදිරිපත් කිරීම' යන සංකල්පවල වාණිජ්‍යමය වැදගත්කම නිර්වචනය හා පැහැදිලි කිරීම.

**නිවැරදි පිලිතුර - B**

1.6

ඉගෙනුම් ප්‍රතිඵල - 5.3.2

තම නියෝජිතයා කෙරෙහි ප්‍රධානියා සතු යුතුකම් සඳහන් කිරීම.

**නිවැරදි පිලිතුර - D**

1.7

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල - 5.7<br><br>හවුල්කරුවන් අතර හවුල් ව්‍යාපාර සම්බන්ධතා ඇති වීම, හවුල්කරුවන් වෙනස් වීම සහ හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම. |
| **නිවැරදි පිළිතුර D** |

1.8

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල -<br><br>7.3.2 සේවා පැය කාලය, සති හා වාර්ෂික නිවාඩු සඳහන් කිරීම.<br>7.3.3 සාප්පු හා කාර්යාල පනත යටතේ සේව්‍යයන් විසින් සැපයිය යුතු පහසුකම් හඳුනාගැනීම. |
| **නිවැරදි පිළිතුර - B** |

1.9

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල -<br><br>7.1.1 සේවක අර්ථ සාධක අරමුදල<br>සේවක භාර අරමුදල<br>පුද්ගලික අර්ථසාධක අරමුදල්<br><br>7.1.3 සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාර අරමුදලට කරනු ලැබූ දායකත්වයන් යලි ලබා ගැනීමට සේවකයින්ට ඉඩ ලැබෙන අවස්ථා කවරේදැයි සඳහන් කිරීම. |
| **නිවැරදි පිළිතුර - B** |

1.10

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල - 8.2.1<br>පහත සඳහන් පනත් කෙටියෙන් හැඳින්වීම - 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත, පරිගණක අපරාධ පනත, පාරිභෝගික ආරක්ෂණ පනත, 2003 අක 36 දරන බුද්ධිමය දේපල පනත |
| **නිවැරදි පිළිතුර - C** |

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

## 2 කොටස

### පිළිතුරු අංක 02

2.1

| ඉගෙනුම් ප්‍රතිඵල - 1.4.1<br><br>පහත ආයතනවල නියාමන භූමිකාව පැහැදිලි කිරීම<br><br>වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති නියාමන මණ්ඩලය, විනිමය සහ සුරැකුම්පත් කොමිසම, කොළඹ කොටස් හුවමාරුව, ආයෝජන මණ්ඩලය, සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, රේගු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව (විනිමය පාලන කාර්යය) |
|---|
| - අයදුම් කිරීමේ අදියරේ සිට වාණිජමය ක්‍රියාකාරීත්ව අදියර දක්වා සියලු අවධිවල දී ආයෝජකයින්ට සහයෝගය දීම.<br>- අපනයන සැකසුම් කලාප පිහිටුවීම හා කලමණාකරනය සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයට බලතල තිබේ.<br>- විදේශ විනිමය ආදායම්වල මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම.<br>- අපනයන ඉපැයුම් ඉහල නංවා ගැනීම.<br>- සෘජු විදේශ ආයේජන සහ දේශීය ආයෝජනයන් මෙරටට ආකර්ෂණය කරගැනීම. |

2.2

| ඉගෙනුම් ප්‍රතිඵල - 2.5.1<br>ගිවිසුම් කඩ කිරීම සඳහා වූ පොදු නීතියේ හා සාධාරණත්ව නීතියේ ප්‍රතිකර්ම පැහැදිලි කිරීම. |
|---|
| - වැඩිදුරටත් ගිවිසුම ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම.<br>- අලාභ ඉල්ලා සිටීම.<br>- ඉටු කළ ප්‍රමාණය සඳහා වන්දි ඉල්ලීම/ " කොන්ටම් මෙරුට්" යන හේතුව මත නඩු පැවරීම.<br>- ගිවිසුම එලෙසම ඉටු කරන ලෙස ඉල්ලා නඩු පැවරීම.<br>- තහනම් නියෝගයක් ලබාගැනීම.<br>- අයථා ධනවත්වීමේ මූලධර්මය යටතේ ප්‍රතිකර්ම ලබාගැනීම. |

NOT FOR SALE

2.3

ඉගෙනුම් ප්‍රතිඵල - 3.1.1

භාණ්ඩ විකිණීම සඳහා වූ ගිවිසුමක් හා වැඩ හා අමුද්‍රව්‍ය සඳහා වූ ගිවිසුමක් අතර වෙනස්කම සාකච්ඡා කිරීම හා එම භාණ්ඩ වර්ගීකරණය

විකිණීමේ ගිවිසුමක වස්තු විෂය වන්නේ භාණ්ඩ හෝ බඩුබාහිරාදිය භාර දීමය.

වැඩ හා අමුද්‍රව්‍ය සඳහා වන ගිවිසුමක් යනු යම් නිපුණතාවයක් අභ්‍යාස කිරීම හා සම්බන්ධ වූවකි, භාණ්ඩ භාර දීම එහිදී ද්විතීක වේ.

2.4

ඉගෙනුම් ප්‍රතිඵල - 7.4.1

සේවකයින්ගේ සේවය අවසන් කිරිමේ (විශේෂ විධි විධාන පනත) සම්බන්ධ ක්‍රියාපටිපාටිය පැහැදිලි කිරීම.

සේවකයා විසින් ලබාදෙන පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

හෝ

කම්කරු කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

2.5

ඉගෙනුම් ප්‍රතිඵල - 8.1.1

වංචාව, සොරකම, මුදල් විශුද්ධිකරණය, අල්ලස් ගැනීම, නොසැලකිල්ල යන සංකල්ප නිර්වචනය කොට ඒ සඳහා තිබෙන ප්‍රධාන විත්තිවාචක පැහැදිලි කිරීම.

"සොරකම" සඳහා තිබෙන ප්‍රධාන විත්තිවාචක පහත පරිදිය.

- යම් දේපලක් සඳහා වූ අයිතිය හෝ හිමිකම අයැදීම - එනම් වරදකරු අදාල දේපල තමාට අයත් වූවක් බව සද්භාවයෙන් විශ්වාස කිරීම.

- මත්වීම - මධ්‍යසාර, රසායනික ද්‍රව්‍ය හෝ මත් ද්‍රව්‍ය නිසා මත්වීමට ලක්වීම.

- මුලාවීම - මෙහි අදහස සොරකම් කිරීම සඳහා වරදකරුව යම් වෙනත් තැනැත්තෙක් විසින් යොමු කිරීම හෝ පෙලඹවීමය.

- දේපල යලි භාර දීම සඳහා වූ චේතනාව - තමා සොරකම් නොකළ බව හා දේපල යලි එහි සැබෑ හිමිකරුට භාරදීමේ චේතනාව මත 'ලබාගත් බවට' වරදකරු ඔප්පු කල යුතුය.

**(2 x 5= ලකුණු** 10)

NOT FOR SALE

# 3 කොටස

## පිළිතුරු අංක 03

| ඉගෙනුම් ප්‍රතිඵල - 2.2.1 |
|---|
| ගිවිසුමකට නියම (කොන්දේසි, ප්‍රතිඥාභාර හා වගකීමෙන් මුක්ත කිරීමේ වගන්ති) යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීම සහ වගකීමෙන් මුක්ත කිරීමේ වගන්තිවල හා 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් නියම පනතේ වගන්තිවල බලපෑම පැහැදිලි කිරීම. |

### (a) කොටස

කොන්දේසියක් යනු ගිවිසුමකට පතුල හෝ මූලය දක්වා ගමන් කරන්නා වූ නියමයකි.

කොන්දේසියක් කඩකිරීම අවිහිංසක පාර්ශවයට ගිවිසුම අවලංගු කිරීම සඳහා අයිතිය ලබා දේ. එසේම අලාභ ඉල්ලා සිටීමට ද පුලුවන.

ප්‍රතිඥාභාරයක් යනු 'ඉටු කල යුතු වුවද ඉටු නොකිරීම නිසා ගිවිසුමේ හරයට හානි වන තරමට වැදගත් නොවන්නා වූ බැඳීමකි'.

ප්‍රතිඥාභාරයක කඩවීම අවිහිංසක පාර්ශවයකට ගිවිසුම අවලංගු කිරීමට අයිතිය ලබා නොදේ. එහෙත් අලාභ ඉල්ලා සිටීමට අයිතිය ලබා දෙයි.

### (b) කොටස

'සාරය' යන යෙදුම භාවිතා කිරීම විසින් පෙන්නුම් කරන්නේ පාර්ශවයන් මෙම වගන්තිය කොන්දේසියක් බවට පත්විය යුතු බවට අපේක්ෂා කල බවය.

එම නිසා මුලී වාරික ගෙවීමට අසමත්වීම කොන්දේසියක් උල්ලංඝණය කිරීමකි.

එම නිසා පරිගණකවල හිමිකරු ලෙස ගිවිසුම නිෂ්ප්‍රභා වූවක් ලෙස සැලකීමට සූචිට අයිතිය තිබේ. එසේම පරිගණකවල භුක්තිය නැවත ලබාගැනීමට ද පුලුවන. තවද ගිවිසුම කඩවීම සම්බන්ධ අලාභ ඉල්ලීමට ද පුලුවන.

මේ හා සමාන කරුණු ඉස්මතු වූ නඩු තීන්දුවකි ***Lombard North Central PLC v Buttersworth [1987] Q.B. 527*** නඩුව.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

## පිළිතුරු අංක 04

### (a) කොටස

| ඉගෙනුම් ප්‍රතිඵල - 3.3.1 |
|---|
| අවදානම සහ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාව පිළිබඳ සාකච්ඡා කිරීම (නිශ්චය නොකල භාණ්ඩ, හිමිකම සංරක්ෂණය, වාරික ගෙවීම, වෙන්දේසියේ විකිණීම, අයිතිකරු නොවු පුද්ගලයා විසින් කරනු ලබන විකිණීම) |

මෙම සිදුවීමේ දී මලු 15 පිළිබඳ සඳහන ආරම්භයේ ගිවිසුම තුළ නොදැක්වුණු අතර විස්තරය තුල පමණක් එය නිර්වචනය කොට තිබිණ..

විස්තරය තුළ නිශ්චය නොකරනු ලැබූ භාණ්ඩ විකිණීම සම්බන්ධ නීතිය වන්නේ එම භාණ්ඩ භාරදිය හැකි තත්වයේ පවතී නම්, ගිවිසුමේ කවර හෝ පාර්ශවයක් විසින් කොන්දේසි විරහිතව එකී භාණ්ඩ ගිවිසුමට ආරෝපණය කරනු ලබන බවත්, එලෙස ආරෝපණය කරන ලබන අවස්ථාවේ මෙම භාණ්ඩවල අයිතිය ගැනුම්කරුට මාරු වන බවත්ය.

මෙහිදී ගිල්බර්ට් මලු පහලොවක් ගිවිසුමට ආරෝපණය කොට තිබෙන අතර පන්ඩු ඊට විරෝධය නොපෑම තුළ ඒ සම්බන්ධ ඔහුගේ අනුමැතිය ගම්‍ය වේ.

එම නිසා මෙම මලු පහලොවේ අයිතිය ආරෝපණය සිදුවන අවස්ථාවේ පන්ඩුට මාරු වී තිබේ.

ඉහත කරුණු සලකා බලන විට කිව හැක්කේ ගිල්බර්ට්ගෙන් මෙම මලු 15 ලබාගන්නා විට ගෙවූ මුදල යලි ඉල්ලා සිටීමට පන්ඩුට සාර්ථකව අවස්ථාව නොලැබෙනු ඇති බවය.

මෙම කරුණු Pignataro vs Gilroy [1919] K.B.459 නඩුවේ කරුණු හා සමානය.

### (b) කොටස

| ඉගෙනුම් ප්‍රතිඵල - 5.2.1 |
|---|
| යම් නියෝජිතයෙක් විසින් සැබෑ බලය (ප්‍රකාශිත හා ව්‍යංග සහ දෘශ්‍යමාන බලය ද ඇතුලුව) ලබාගන්නා අවස්ථා කවරේද යන්න පැහැදිලි කිරීම. |

සමාගම් ලේඛම්වරයා වන අලෝමා සමාගමේ නිලධාරියෙක් වන අතර ඒ නිසා ඇය එම සමාගමේ නියෝජිතයෙක් වේ.

මෙම සිදුවීම තුල ඇයට ගෘහභාණ්ඩ කුලියට ගැනීමට සැබෑ බලය ලබා දී නොතිබුණද ඇය සමාගම් ලේඛම්වරයා යන කරුණ ගෘහභාණ්ඩ කුලියට දෙන සමාගමට ඇයට එසේ කුලියට ගැනීමට බලය තිබෙන බවට වූ හැඟීම ලබා දේ. මේ වර්ගයේ බලය 'දෘශ්‍යමාන' අධිකාරිය ලෙස හැඳින්වේ.

එම නිසා සමාගමේ නිලධාරිනියක ලෙස අලෝමාට සමාගම වෙනුවෙන් ගෘහ භාණ්ඩ මිල දී ගැනීමට දෘශ්‍යමාන බලය තිබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස කුලියට ගත් ගෘහභාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට සමාගම බැඳී සිටී.

ප්‍රසිද්ධ නඩු තීන්දුවක් වන "පැනෝරාමා ඩිවලප්මන්ට්ස් එදිරිව ෆදෙලිස් ෆර්නිෂින් ෆැබ්රික්ස්" [1971]2.Q.B.711 දී සමාන අවස්ථාවක් සිදු වී ඇත. මෙහිදී පෞද්ගලික පරිහරණය සඳහා ලේකම් විසින් කුලියට ගන්නා ලද මෝටර් රථ සඳහා වන කුලිය ගෙවීමට සමාගම බැඳී ඇත.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

# නිවේදනය

මෙහි ලබාදුන් පළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම˜" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු˜" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාහාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඒට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**